**නාමල්ඔය ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ  මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.  පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී ආදායම රු.223,215 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වරද නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම් රු.236,958 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන ණය හිමි ශේෂය රු.1,687,040 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | පොල්වත්ත කඩ කාමර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු රු.453,000 ක මුදල සංවර්ධන ණයහිමියන් යටතේ දෙවරක් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ පරගහකැලේ සංස්කෘතික මධ්‍යස්ථානය අසළ භෝජනාගාරය හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.4,190,158ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.365,793 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය හා ප්‍රාග්ධන යෙදවුමට ආදායම්/ආධාර මගින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.11,509,642 ක නොසැසඳීමක් පැවතුණි. | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වරද නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | නොසැසඳීම් සඳහා හේතු පරීක්ෂා කර නිවැරදි කරගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.40,005 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.450,291 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් බැංකු ගිණුම් දෙකකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.28,886 ක ශේෂ 03ක් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආණ්ඩුකාර අනුමැතිය ඉල්ලා තිබුණ ද අවශ්‍ය උපදෙස් ලැබී නොමැත. නැවත ලිපියක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 ආදායම් පරිපාලනය**

**ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 350,000 | 161,500 | 161,500 | - | 206,000 | 222,450 | 222,450 | - |
| ii. | කුලී | 4,173,540 | 1,859,264 | 1,878,272 | 3,100 | 2,502,890 | 3,049,672 | 3,027,565 | 22,108 |
| iii. | බලපත්‍ර ගාස්තු | 837,000 | 393,945 | 393,945 | 22,505 | 666,000 | 507,085 | 484,580 | 22,505 |
| iv. | වෙනත් ආදායම් | 3,425,505 | 1,563,614 | 1,563,614 | 15,008 | 565,045 | 2,117,236 | 2,117,236 | 15,008 |
| | එකතුව | 8,786,045 | 3,978,323 | 3,997,331 | 40,613 | 3,939,935 | 5,896,443 | 5,851,831 | 59,621 |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.196,526,918 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළව එක් එක් අයිතම අනුව වටිනාකම් ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | වෙන වෙනම අලුතින් ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම, සුසාන භූමි 15ක හා ක්‍රීඩා පිටි 07ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී කමිටුවක් පත්කර එමගින් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලද භාණ්ඩ අයිතම 20 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් ටේලරයක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | එම ටේලරය 1994 වර්ෂයේ පමණ ලැබී ඇති බැවින් ඒ පිළිබඳ කිසිඳු තොරතුරක් අප වෙත නොමැති නිසා ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව. | -එම- |
| (ඉ) | සභාව සතුව පවතින අලුත්වැඩියා කළ නොහැකි වාහන 03 ක් වසර 07 සිට වසර 23 දක්වා කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වාහන වෙන්දේසි කිරීම සඳහා එහි අයිතිය අප වෙත පවරා දී නොමැති අතර ඒ බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලයට දැනුම් දී ඇති බව. | අදාළ ආයතන වෙත ඉදිරිපත් කර වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාව සතුව පවතින වාහන 05 ක අයිතිය සභාව නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වාහන පැවරීම් ඉල්ලුම් කර ඇති නමුත් ඒවා පවරා නොදෙන බව. | වාහනවල ලියාපදිංචි අයිතිය සභාවේ නමට පවරාගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සේවක ණය ලේඛනය අනුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ 02 ක් වසර 11 සිට වසර 16 දක්වා කාලයක සිට අය නොවී පවතින බව පැවතුණි. | අදාල ආයතන වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති මුත් මෙතෙක් අයකර එවා නොමැති බව. | හිඟ ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 08 ක් පුරප්පාඩුව පවතින බව පැවතුණි. | මාසික වාර්තා මඟින් මේ බව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |